# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,717 — 1966 ඔක්තෝබර් 14 වැනි සිකුරාදා — 1966.10.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 711 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| යතුරු-ඇබෑර්තු ... ... ... ... | 717 | අය-වැය ලේඛන ... ... ... | 724 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 722 | ජලපළ විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 722 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම් ... ... | 728 |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසට අතිරේකයක් වශයෙන් 1963 ජනවාරි සිට මාර්තු දක්වා පළ කරන ලද පුස්තක නාමාවලියක් ද අඩංගු වේ.]

## පළාත් පාලන නිවේදන

ඇල්. ඕ—බී 69/41
ා. පා. දෙ. ජීසී. 2/1/16

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොකරැල්ල ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දීය.

10-455—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ—බී 131/49

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

(477 වැනි අධිකාරය වන) සුනඛයන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 26 දින,
කොළඹ දීය.

### ආඥාව

දන්කොටුව නගරය. (477 වැනි අධිකාරය වන) සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතට මෙයින් ගෙනෙනු ලබන අතර ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා එකී නගරයේ සීමා, (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 2, 5, 6 හා 9 වැනි වගන්ති යටතේ පනවනු ලැබ, 1963 මැයි 23 වැනි දින අංක 13,646 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ආඥාවෙහි පළමුවැනි උපලේඛනයෙහි විස්තර කරනු ලැබූ දන්කොටුව සුළු නගර සභාවේ පරිපාලන සීමා විය යුතුය.

10–454—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1966 ජූලි මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

ඇල්. ඕ—බී 69/41
ප.පා.දෙ. ජීසී. 2/1/37

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිගල්ල ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

එම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 20 දින,
කොළඹදී ය.

10–437—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඕ—බී 69/41

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන් බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ගම් ප්‍රදේශය තුල ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 15 දින,
කොලඹ දීය.

10–426—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

එල්.ඕ.—බී. 196/38
එල්.ජී.ඕ.—ජී. 328.

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 49 සහ 52 යන වගන්ති යටතේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබ 1964 මැයි 29 වන දින හා අංක 14,046 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද, සිංහල අනුවාදය ද එම ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද, දෙමළ අනුවාදය 1965 පෙබරවාරි 19 වන දින හා අංක 14,323 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද ව්‍යවස්ථාව උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ඔක්තෝබර් මස 1 වන දින,
කොළඹ දී ය.

10–467—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

ඇල් ඕ—බී 8/53

## ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියි බලධරයා විසින් එනම් කොළඹ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් ස්ථිර කරන ලද නියෝග.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් 15 දින,
කොළඹදීය.

### නියෝග

1. ගෝ ඝාතක ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද පොදු ගෝඝාතක ස්ථානය, සෞඛ්‍ය කටයුතු භාර නිලධාරියාගේ හෝ සභාපති විසින් ඒ සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝ ඝාතක ස්ථානය ඇතුලත විනය හා සනීපාරක්ෂක තත්වය සම්බන්ධයෙන් ඒ නිලධරයා විසින් වග කිය යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) සෞඛ්‍ය කටයුතු භාර නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපති විසින් පත් කරන ලද නිලධරයා විසින් ඒ සතා පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම් සුදුසු යයි අනුමත කර තිබේ නම්, මිස හෝ

(ආ) යම් දිනයක පූ. භා. 7.00 ටත් 9.00 ටත් අතර මිස,

ගෝ ඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එසේ වුවද විශේෂ අවස්ථාවකදී මෙහි සඳහන් වේලාවට වෙනස් වූ වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

(2) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72 කාලයක් ගතවූවාට පසු යම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝ ඝාතක ස්ථානයෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම් ඒ සතා නැවතත් පරීක්ෂා [illegible] පිණිස මැරීම සුදුසු යයි එම ඡේ[illegible] අනුමත කරන ලද්දේ නම් මිස ගෝ ඝාතක [illegible]යේ දී නොමැරිය යුතුය.

3. ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියට යම් [illegible]තෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියේ නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම් බීම් නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පියවරක්ම ගත යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතෙකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියහොත්, 2 වැනි නියෝගයේ සඳහන් යම් නිලධරයකු විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝ ඝාතක ස්ථානයේ දී මරනු ලැබූ යම් සතෙකුගේ මස් හෝ අතුනුබහන් ආදිය 2 වැනි නියෝගයේ සඳහන් වූ යම් නිලධරයකුගේ මතය අනුව ලෙඩ සහිත හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු වෙතොත් ඔහු විසින් ඒ මස හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත්, ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම වළක්වන අන්දමින් ඉවත් කරවිය යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගය යටතේ මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට ගෝ ඝාතක ස්ථානය භාර නිලධරයා විසින් අවසර නොදිය යුතුය.

8. (1) මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් 2 වැනි නියෝගයෙහි සඳහන් වූ යම් නිලධරයකුගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණුපයේ ඉස්සරහ ගාත්වල ගෝ ඝාතක ස්ථානය භාර වූ නිලධරයා විසින් "මිනුවන්ගොඩ ග. ස" යන සළකුණ සහ

අවස්ථා වෝචිත පරිදි "ගවමස්, ඌරු මස් හෝ එළු මස්" යන වචන මුද්‍රා තබා ඇතහොත් මිස කිසිම තැනැත්තකු විසින් ගෝ ඝාතක ස්ථානයෙන් ඒ කුණුපය ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතෙකු ඉදිරිපිටදී හෝ ඒ ස්ථානයේ කලින් මරන ලද යම් සතෙකුගේ කුණුපය ඉවත් කර හෝ මුවා කර, ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු කිසිම සතෙකු නොමැරිය යුතුය.

10. ස්පර්ශයෙන් බෝවන රෝගයකින්, සමේ රෝගයකින් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනා වූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියා වූ කිසිම් කෙනකුට එකී රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරනු ලැබීමට ගතවන කාල සීමාවන් පසුවන තුරු යම් ගෝ ඝාතක ස්ථානයක් භාරව සිටින තැනැත්තා විසින් එකී ගෝ ඝාතක ස්ථානයට ඇතුල්වීමට හෝ යම් සතෙකු මැරීමේ කටයුත්තකට සහභාගිවීමට ඉඩ නොදිය යුතුය.

11. (1) මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට යටත්ව ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම හෝ සතුන් මැරීම සඳහා අයකළ යුතු ගාස්තුව පහත සඳහන් ප්‍රමාණයන් අනුව විය යුතුය:—

| | රු. ශ |
|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | 1 00 |
| බැටළුවන්, ඌරන් හෝ එළුවන් සඳහා එකකුට ... | 1 00 |

එසේ වුවද යම් සතෙකු ගෝ ඝාතක සථානයට ගෙන එන ලදුව මැරීම සඳහා නුසුදුසු යයි ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ මැරීමෙන් ඉවත් කරනු ලැබූ විට ඒ සතා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තුව ශත 50 ක් පමණක් විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නියමිත ගාස්තුව එකී සතා සම්බන්ධයෙන් සභාවට ගෙවා එකී ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යය වශයෙන් ලබාගත් කාර්යාල කුවිතාන්සිය ගෝ ඝාතක ස්ථානය භාරකාරයා වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිය යුත්තේ යම් තැනැත්තකු වෙතද, ඒ තැනැත්තා වශයෙන් සභාපති විසින් ලියවිල්ලකින්, පත් කළ හැකි වෙන යම් නිලධරයකු වෙත එය ඉදිරිපත් කරන තුරු ගෝ ඝාතක ස්ථානය තුළ සතෙකු මැරීම හෝ එම ස්ථානයෙන් සතෙකු ඉවත් කිරීම නොකළ යුතුය.

12. ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින්, ගෝ ඝාතක ස්ථානයේ මරනු ලබන—

(අ) සියලුම ගවයින්ගේ නාම ලේඛනයක්ද,

(ආ) සියලුම එළුවන්ගේ, බැටළුවන්ගේ, ඌරන්ගේ හා හරකුන්ගේ නාම ලේඛනයක්ද තබා ගත යුතුය. ඒ නාම ලේඛනය පහත සඳහන් ආකෘතියට සාරානුකූලව විය යුතුය :—

| | | |
|---|---|---|
| | හරක් කුවිතාන්සියේ අංකය :— | |
| | විස්තර :— | |
| | පාට :— | |
| | වයස :— | |
| | දකුණු පැත්ත :— | හණවර :— |
| | වම් පැත්ත :— | |
| | ගෝඝාතකයාගේ නම :— | |
| | හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය :— | |
| | පරීක්ෂා කළ දිනය :— | |
| | මරණ දිනය :— | |
| | හරක් භාරගන්නා නිලධරයාගේ කෙටි අත්සන :— | |
| | වැඩිපුර කරුණු :— | |

13. මේ නියෝගවල—

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් මිනුවන්ගොඩ ගම් සභාව අදහස් වේ; තවද

"ආඥාපනත" යන්නෙන් (272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනත අදහස් වේ.

9-431—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 8/53 ප. පා. දෙ.—ජී.ඊ. 19/1/9/3

## ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ ඒ සඳහා නියි බලධරයා විසින් එනම්, කොළඹ දිස්ත්‍රික්කයේ පමුණුගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් පළාත්පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් ස්ථිරකරන ලද නියෝගය.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.9.15 දින,
කොළඹ දී ය.

### නියෝග

1. ගෝඝාතක ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත කරන ලද පොදු ගෝඝාතක ස්ථානය, සෞඛ්‍ය කටයුතු භාර නිලධරයාගේ හෝ සභාපති විසින් ඒ සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝඝාතක ස්ථානය ඇතුළත විනය හා සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් ඒ නිලධරයා විසින් වගකිව යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) සෞඛ්‍ය කටයුතු භාර නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපති විසින් පත් කරන ලද නිලධරයකු විසින් ඒ සතා පරීක්ෂාකොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි අනුමතකර තිබේ නම් මිස, හා

(ආ) යම් දිනයක පූ. භා. 7.00ටත් 9.00ටත් අතර මිස, ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. ගෝඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමියේ නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම් බීම් නිසැකව ම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පියවරක්ම ගත යුතුය.

4. ගෝඝාතක ස්ථානයට අයිති භූමියට යම් සතෙකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ-නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතෙකු 2 වෙනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියහොත් 2 වැනි නියෝගයේ සඳහන් යම් නිලධරයකු විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝඝාතක ස්ථානයේදී මරනු ලැබූ යම් සතෙකුගේ මස් හෝ අතුනු බහන් ආදිය 2 වැනි නියෝගයේ සඳහන් වූ යම් නිලධරයකුගේ මතය අනුව ලෙඩ සහිත හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු වෙතොත් ඔහු විසින් ඒ මස හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම වළක්වන අන්දමින් ඉවත් කරවිය යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගය යටතේ මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට 2 වැනි නියෝගයෙහි සඳහන් කිසිම නිලධරයකු විසින් අවසර නොදිය යුතුය.

8. (1) මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් 2 වැනි නියෝගයෙහි සඳහන් වූ යම් නිලධරයකුගේ නියමය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණුපයේ ඉස්සරහා ගාත්වලත් පස්සා ගාත්වලත් 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකු විසින් " පමු. ග. ස. " යන සළකුණ මුද්‍රා තබා ඇතහොත් මිස කිසිම තැනැත්තකු විසින් ගෝඝාතක ස්ථානයෙන් ඒ කුණුපය ඉවත් නො කළ යුතුය.

(3) වෙන යම් සතෙකු ඉදිරිපිට දී හෝ ඒ ස්ථානයේ කලින් මරන ලද යම් සතෙකුගේ කුණුපය ඉවත් කර හෝ මුවා කර, ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු කිසිම සතෙකු නොමැරිය යුතුය.

9. ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින්, සමේ රෝගයකින් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනකුට ලඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනකුට එකී රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරනු ලැබීමට ගතවන කාල සීමාවන් පසුවන තුරු 2 වැනි නියෝගයෙහි සඳහන් නිලධරයකු විසින් එකී ගෝඝාතක ස්ථානයට ඇතුල්වීමට හෝ යම් සතෙකු මැරීමේ කටයුත්තකට සහභාගිවීමට ඉඩ නොදිය යුතුය.

10. (1) මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට යටත්ව ගෝඝාතක ස්ථානය හා හරක් කොටුව පාවිච්චි කිරීම සඳහා අයකළ යුතු ගාස්තුව පහත සඳහන් ප්‍රමාණයන් අනුව විය යුතුය :—

| | රු. | ශ. |
|---|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | 2 | 0 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා එකකුට ... | 1 | 0 |

එසේ වුවද යම් සතෙකු ගෝඝාතක ස්ථානයට ගෙන එන ලදුව මැරීම සඳහා නුසුදුසු යයි, ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ මැරීමෙන් ඉවත් කරනු ලැබූ විට ඒ සතා සම්බන්ධයෙන් අයකළ යුතු ගාස්තුව ශත 50ක් විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නියමිත ගාස්තුව එකී සතා සම්බන්ධයෙන් සභාවට ගෙවා එකී ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් ලබාගත් කාර්යාල කුවිතාන්සිය 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකු වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිය යුත්තේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා වශයෙන් සභාපති,විසින් ලියවිල්ලකින්, පත් කළ හැකි වෙන යම් තැනැත්තකු වෙත එය ඉදිරිපත් කරන තුරු ගෝඝාතක ස්ථානය තුළ සතෙකු මැරීම හෝ එම ස්ථානයෙන් සතෙකු ඉවත් කිරීම නොකළ යුතුය.

11. ගෝඝාතක ස්ථානය භාරකරු විසින්, ගෝඝාතක ස්ථානයේ මරනු ලබන—

(අ) සියලුම ගවයින්ගේ නාම ලේඛනයක් ද,

(ආ) සියලුම එළුවන්ගේ, බැටළුවන්ගේ, හා හරකුන්ගේ නාම ලේඛනයක් ද තබාගත යුතුය. ඒ නාම ලේඛනය පහත සඳහන් ආකෘතියට සාරානුකූලව විය යුතුය.—

| හරක් කුවිතාන්සියේ අංකය | විස්තර | පාට | වයස | හණවර: දකුණු පැත්ත | හණවර: වම් පැත්ත | ගෝඝාතකයාගේ නම |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

| හරක්කොටුවට ඇතුළත් කළ වේලාව සහ දිනය | පරීක්ෂා කළ දිනය | මරණ දිනය | හරක් භාරගත් නිලධාරියාගේ කෙටි අත්සන | වැඩිපුර කරුණු |
|---|---|---|---|---|
| | | | | |

12. මේ නියෝගවල—

" සභාපති " යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

" සභාව " යනුවෙන් පමුණුගම ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ. තවද,

" ආඥාපනත " යනුවෙන් (272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනත අදහස් වේ.

10-425—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

අංක 8 දරණ සංදේශය

**සේවාවන් නවත්වනු ලැබ ඇති, නැවත පළාත් පාලන සේවයට බඳවා ගනු නොලබන නිලධාරීන් පිළිබඳ විස්තර සටහන**

| සම්පූර්ණ නම සහ ලිපිනය | පත්වීම | සේවයට ඇතුලත්වූ දිනය | සේවය නැවැත්වූ දිනය | සේවයෙන් පහකරනු ලැබී ද? ඇගේ/ඔහුගේ තනතුර අතහැර ගියේද? අකාර්යක්ෂමතාව උඩ විශ්‍රාම ගන්වනු ලැබීද? ඉල්ලා අස්වීමට ඉඩ දෙන ලදද? | සේවයෙන් පහකිරීමට හේතුව | ප.පා. සේ. කො. ස ලිපි සම්බන්ධය |
|---|---|---|---|---|---|---|
| එගොඩගේ ලින්කන් එඩ්වඩ් කලනතිස්ස ගුණවර්ධන ... | කොළඹ නාගරික සභාවේ පරීක්ෂක ... | 52. 9. 2 ... | 62. 5. 1 ... | තනතුර අත්හැර යන ලදී. ... | — ... | පී.ඇප්. 75/52 |
| එස්. රාසයියා, 21, ඉච්චමොඩෙයි පාර, යාපනය ... | කම්මාන්ත ඉංජිනේරු, යාපනය නාගරික සභාව ... | 60.12. 1 ... | 63. 3. 5 ... | සේවය නතර කරන ලදී ... | තනතුර සඳහා එවන ලද අයදුම්පතෙහි අත්‍යාවශ්‍ය තොරතුරක් සැඟවීම | පී.ඇප්. 339/60 |
| මයිල්වාගනම් වෛරවපිල්ලෙයි, අංක 20, 25 වෙනි පටුමග, ග්‍රීන්පාත්, කොල්ලුපිටිය | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 62. 8. 2 ... | 62. 8.21 ... | තනතුර අත්හැර යන ලදී ... | — ... | පී.ඇප්. 377/62 |
| වල්ලිපුරම් බාලසුබ්‍රමානියම්, නෙදුන්කර්නි, කරවෙඩ්ඩි... නැගෙනහිර, කරවෙඩ්ඩි ... | ට්‍රොලිබස් කොන්දොස්තර, කොළඹ නාගරික සභාව | 57, 7.16 ... | 63. 7.27 ... | සේවයෙන් පහකරන ලදී ... | චෝදනාවලට වරද කරුවීම ... | පී.ඇප්. 313/57 |
| හෙරවල මහවත්තගේ දොන් කැල්වින් පියදාස ... | ගිනිභට, කොළඹ නාගරික සභාව ... | 61. 2.20 ... | 63.10.29 ... | ආධුනික සේවය නතර කරන ලදී... | උසාවියෙන් වරදකරු වීම ... | පී.ඇප්. 80/61 |
| දොන් ජස්ටින් සිරිල් ජයසූරිය ... ... | පශු වෛද්‍ය, කොළඹ නාගරික සභාව ... | 57. 6. 1 ... | 61. 6.27 ... | තනතුර අත්හැර යන ලදී ... | — ... | පී.ඇප්. 152/57 |
| අසරප්පුලිගෙ ඇන්ටනි ඇලෝසියස් තිලකරත්න සිල්වා ... | II ශ්‍රෙ. ආදායම් හා කම්මාන්ත ඕවර්සියර්, කන්දපල්ල අංක 2, ගම්සභාව | 63. 2. 1 ... | 63. 9.15 ... | සේවයෙන් පහකරන ලදී ... | ප්‍රමාණවත් කාලයක් ඉදිරියට තබා දැනුම් දීමක් නොකළ බැවින් මාසයක වැටුප් ගෙවීමට සහ ඔහුට දෙන ලද වෙප් එකක් වෙනුවෙවෙන් රු. 42.50ක් ගෙවීමට අපොහොසත් වීම | පී.ඇප්. 40/63 |
| විවිල් රන්ජිත් ඇනස්ලි ද මෙල් ... ... | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 62. 3. 3 ... | 62.10. 4 ... | සේවයෙන් පහකරන ලදී | ප්‍රමාණවත් කාලයක් ඉදිරියට තබා දැනුම්දීමක් නොකළ හේතුවෙන් මාසයක වැටුප් ගෙවීමට අපොහොසත් වීම | පී.ඇප්. 70/62 |
| වාසල මුදියන්සේලාගේ කිරිහාමිගේ පින්හාමි ... | ලිපිකරු, බටහිර කඩවත් කෝරලේ ගම්සභාව ... | 57. 4.22 ... | 63.12. 6 ... | සේවයෙන් පහකරන ලදී ... | රාජකාරි පැහැර හැරීම හා මුදල් අයුතු අන්දමින් නතුකර ගැනීම | පී.ඇප්. 121/57 |
| කරුණාරත්න හේවාසුන්දර ... ... | ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, දකුණු නුවර ගම් කෝරලේ ගම්සභාව | 61. 2.15 | 63. 2. 1 ... | සේවයෙන් පහකරන ලදී ... | ගම්සභාව හා ඔහු අතර බැඳීම් ඉටු කිරීමට හා රු. 500ක් ගෙවීමට අපොහොසත්වීම | පී.ඇප්. 44/61 |
| තම්පපිල්ලෙයි වෙල්වරාජ්, ටී. එස්. තම්පපිල්ලෙයි බාරේ, 135, මුහුදුබඩ පාර, කල්මුනෙයි | II ශ්‍රෙ. ආදායම් ඕවර්සියර්, කල්මුනෙයි සුළු නගර සභාව | 62. 5. 2 ... | 62.11. 5 ... | තනතුර අත්හැර යන ලදී ... | ප්‍රමාණවත් කාලයක් ඉදිරියට තබා දැනුම් නොදීම හේතුවෙන් මාසයක වැටුප් ගෙවීමට අපොහොසත් වීම | පී.ඇප්. 178/62 |
| මුතුකුට්ටි ආරච්චිගේ දයාරත්න, ජේ. නෙක්කසිංඤො බාරේ, නවාන, කොටදෙනියාව | II ශ්‍රෙ. ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, බින්තැන්න ගම්සභාව | 59. 2. 1 | 61. 3. 1 ... | සේවයෙන් පහකරන ලදී ... | ගම්සභාව හා ඔහු අතර බැඳීම් ඉටු කිරීමට නොහැකිවීම හා රු. 125ක මුදලක් ගෙවීමට නොහැකිවීම | පී.ඇප්. 42/59 |
| සිඩ්නි ප්‍රසාද් වෙරණියගොඩ, රජමහල්, කයිකාවල, ඉඳුරුව | II ශ්‍රෙ. ආදායම් ඕවර්සියර්, හබරාදුව ගම්සභාව ... | 62. 9.20 ... | 62.10. 1 ... | තනතුර අත්හැර යන ලදී ... | අස්වීමට මාසයක් කල් නුදුන් බැවින් මසක වැටුප් නොගෙවූ බැවින් | පී.ඇප්. 349/62 |
| වී. පුන්නියමූර්ති ... ... ... | ලිපිකරු, චන්කාලෙයි ගම්සභාව ... | 60. 2. 1 ... | 60. 3.31 ... | තනතුර අතහැර යන ලදී ... | — ... | පී.ඇප්. 159/60 |

අංක 8 දරණ සංදේශය—සම්බන්ධයි.

| සම්පූර්ණ නම සහ ලිපිනය | පත්වීම | සේවයට ඇතුලත්වූ දිනය | සේවය නැවැත් වූ දිනය | සේවයෙන් පහකරනු ලැබී ද? ඇගේ/ඔහුගේ තනතුර අතහැර ගියේද? අකාර්යක්ෂමතාව උඩ විශ්‍රාම ගන්වනු ලැබීද? ඉල්ලා අස්වීමට ඉඩ දෙන ලදද? | සේවයෙන් පහකිරීමට හේතුව | ප.පා. සේ. කො. ස. ලිපි සම්බන්ධය |
|---|---|---|---|---|---|---|
| මුන්දිගල පතිරගේ චන්ද්‍රසේන | ලිපිකරු, ගාල්ල නාගරික සභාව | 60.12.22 | 60.12.23 | තනතුර අත්හැර යන ලදී | අස්වීමට මාසයක් කල් නුදුන් බැවින් හා මයක වැටුප් නොගෙවූ බැවින් | පී.ඇප්. 367/60 |
| ජෝසප් බීඩ් හැරල්ඩ් ගුණසේකර | II ශ්‍රෙ. ගබඩාභාරකරු, බදුල්ල නාගරික සභාව | 54. 7. 1 | 64. 4. 4 | සේවයෙන් පහකිරීම | චෝදනාවලට වරදකරුවීම | පී.ඇප්. 132/54 |
| ඉනේරිස් කිරිමාඩුව | ගිනිහට, කොළඹ නාගරික සභාව | 55.11.21 | 59. 3. 9 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 261/55 |
| රොබට් ලෙස්ලි ගුණවර්ධන | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 62. 7.19 | 64. 8.28 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 389/62 |
| වෙල්ලයියා අනන්තරාජා | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 62. 2.16 | 64. 4. 8 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 126/62 |
| අභංගම විතානගේ තෝමස් පෙරේරා | ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 53. 9. 7 | 64.11.21 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 365/53 |
| මහලන්දගේ ශාන්තලාල් පියරත්න | ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 53. 3. 2 | 64.10.19 | තනතුර අත්හැර යන ලදී | ... | පී.ඇප්. 114/53 |
| ලොකුගමරාලගේ කරුණාරත්න | ලිපිකරු, සිංහලපත්තු ගම්සභාව | 58.11. 7 | 65. 6.18 | සේවයෙන් පහකරනු ලදී | ගම්සභාවේ අරමුදල් වංචා කිරීම | පී.ඇප්. 229/58 |
| වෙට්ටිවේල් සෙල්වරාජා | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 64.11 2. | 64.11.13 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 562/64 |
| කනවීර ආරච්චිගේ රිචඩ් පෙරේරා | ලිපිකරු, එගොඩපොත ගම්සභාව | 44.12. 1 | 65. 8.23 | සේවයෙන් පහකරන ලදී | ගම්සභාවේ අරමුදල් වංචා කිරීම | පී.ඇප්. 635/46 |
| දොන් චාර්ල්ස් ගුණවර්ධන | ලිපිකරු, මතුගම සුළු නගර සභාව | 59. 9.11 | 65. 5. 2 | තනතුර අත්හැර යන ලදී | — | පී. ඇප්. 256/59 |
| කලුපෙරුම සිරිල් ද සිල්වා | II ශ්‍රෙ. ආයුර්වේද වෛද්‍ය, කැළණිය සුළු නගර සභාව | 65. 3.10 | 65. 4. 5 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 83/65 |
| ලයනල් ක්ලැරන්ස් මාටින්, අශෝක පටුමග, මඩවලමුල්ල, ගාල්ල | ලිපිකරු, කොළඹ නාගරික සභාව | 63. 8. 1 | 65. 8. 1 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 291/63 |
| පොන්නුසාමි පෝල් ක්‍රිස්ටි, 227/1, හයිලෙවල් පාර, නුගේගොඩ | ලිපිකරු, කනුවන ගම්සභාව | 62. 8. 1 | 64. 2. 8 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 297/62 |
| පලිහවඩන ආරච්චිගේ ජෝසප් ලයනල් ගේබ්‍රියල් පෙරේරා | ලිපිකරු, අපරැක්ක-බබරැන්ද ගම්සභාව | 65. 2. 1 | 65. 8.14 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 70/65 |
| මුත්තයියා දේවකුඩච්චන් ඩැනියෙල් | පශුවෛද්‍ය, කොළඹ නාගරික සභාව | 51. 8.17 | 66. 1.12 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 357/51 |
| ජී. ඩබ්ලිව්. පියදස, තලාගස්දෙනිය, හික්කඩුව | II ශ්‍රෙ ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, බටපොල ගම්සභාව | 62.10. 5 | 65.10. 6 | ආධුනික සේවය නතර කිරීම | ගම්සභා මුදල් අයථා අන්දමින් පරිහරණය කිරීම | පී.ඇප්. 361/62 |
| කේ. පී. අබේරත්න | ලිපිකරු, බදුල්ල නාගරික සභාව | 65. 9. 6 | 65.10. 7 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 204/65 |
| ගහබොඩ හේවගේ ජයවීර | ඉංජිනේරු ඕවර්සියර්, කොළඹ නාගරික සභාව | 64. 9.16 | 64.12. 7 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 455/64 |
| ගොඩකුරු පතිරන්නැහැලාගේ පුංචි බණ්ඩා | එම. | 64.10. 1 | 65.10. 1 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 454/64 |
| කෝරාලආරච්චිගේ දොන් ෂෙල්ටන් | එම. | 64.10. 1 | 66. 5. 4 | තනතුර අත්හැර යන ලදී | — | පී.ඇප්. 570/64 |
| හබීබ් මොහමඩ් මරික්කාර් සයිනුදීන් කල්පිටිය 'අල්හම්බ්‍රා' | II ශ්‍රෙ. පුස්තකාලයාධිපති, අළුත්ගම සුළු නගර සභාව | 58. 9.16 | 65.11.29 | තනතුර අත්හැර යන ලදී | වෛද්‍ය සහතික ඉදිරිපත් නොකර සේවයට නොපැමිණීම | පී.ඇප්. 154/58 |
| ඇල්. ටී. ඇම්. සිල්වා | II ශ්‍රෙ. කම්කරු, හංවැල්ල පේරුව ගම්සභාව | 64. 3.2 | 66. 2.26 | තනතුර අත්හැර යන ලදී | — | ටී.ඇප්. 85/64 |
| රිචඩ් වික්‍රමසිංහ, මනන්ගොඩ | සාමාන්‍ය පෙළ ලිපිකරු, අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව | 65. 6.1 | 65. 8. 2 | තනතුර අත්හැර යන ලදී | — | ටී.ඇප්. 204/65 |

10–470—66.10.14 දින අංක 14,717 දරණ ගැසට් පත්‍රය

## පළාත් පාලන දැන්වීම්

### ගම්පොල නගර සභාවේ ඡන්ද කොට්ඨාශයන්හි සීමාවන් පුළුල් කිරීම හා ඒවා නැවත බෙදා වෙන් කිරීම

පළාත් පාලන ගරු ඇමතිතුමා විසින්, පහත සඳහන් කරුණු ගැන පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා විශ්‍රාම ලත් දිස්ත්‍රික් විනිශ්චයකාර ඒ. ඕ. ඇස්. දිසානායක මහතා කොමසාරිස් වශයෙන් පත් කර ඇත.

පරීක්ෂණයට භාජනවන කරුණු :—

(අ) ගම්පොල නගර සභාවෙන් පිටත දැනට පිහිටා ඇත්තාවූද අවශ්‍ය වෙතොත්, එකී නගර සභාවට ඇතුලත් කළ යුතුවූද ප්‍රදේශ ;

(ආ) ප්‍රදේශය, ජනගහනය හා වෙනත් කැරණු ඇතොත් ඒවාද සැළකිල්ලට ගත් විට, ගම්පොල නගර සභාවේ සිටිය යුතු සභික සංඛ්‍යාව ;

(ඇ) නගර සභාවේ සීමාවන් විස්තර කිරීම, හා

(ඈ) එසේ බෙදා වෙන් කරණු ලබන එක් එක් කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාවෙහි හැකි තරම් දුරට සමාන බවක් ඇති වන බවට වගබලාගත හැකිවන පරිදි, නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවන් විස්තර කිරීම.

2. ඉහත සඳහන් කාරණයන් සියල්ලම ගැන හෝ ඉන් කොටසක් ගැන හෝ අදහස් දැන්වීමට කැමති සීමාව සංවිධානයකට හෝ පුද්ගලයින්ට ඒ පිළිබඳව කරුණු ලිය කියවිලි මඟින් 1966 යේ ඔක්තෝම්බර් මස 25 වෙනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් අත්සන් කළ අයවෙත ඉදිරිපත් කරණ ලෙස පරීක්ෂණ කොමිෂම මෙයින් ඉල්ලා සිටී.

3. ඉදිරිපත් කරණ ලිය කියවිලි පිටපත් දෙකකින් (2) යුක්ත විය යුතු අතර, පැහැදිලි අකුරින් ලියා තිබිය යුතුයි.

4. 1966 යේ නොවැම්බර් මස 5 වෙනි, 6 වෙනි සහ 7 වෙනි දිනයන්හිදී ගම්පොල නානායමේ කොමිෂන් කායතිලයේදී වාචික නියෝජනයන් ගැන සලකා බැලීමට පරීක්ෂණ කොමිෂම රැස්වෙනවා ඇත.

5. ඉහතකී කරුණුවලට අදාලදේ ගැන වාචික සාක්ෂිදීමට කැමති අයගේ නම් සහ ලිපිනයන් 1966 ඔක්තෝම්බර් 25 වෙනි දිනට හෝ ඊට ප්‍රථම පහත දැක්වෙන ලිපිනයට එවන ලෙස පරීක්ෂණ කොමිෂම ඉල්ලා සිටී. වාචික නියෝජනයන් ඇසීම සඳහා වේලාවන් හා දිනයන් ඒ ඒ අයවෙත ලියා දන්වනු ලැබේ.

එල්. එම්. සමරසිංහ,
පරීක්ෂක කොමිෂමේ ලේකම්.

1966 ඔක්තෝබර් මස 9 වෙනි දින,
මහනුවර පළාත් පාලන අමාත්‍යාංශයේ දීය,
මහලේකම් ගොඩනැගිල්ල,
මහනුවර.

10–588—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## ගම්සභා ආඥපනත

### 17 වන වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥපනතේ (257 වන අධිකාරයේ) 17 (5) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර, මාතලේ මධ්‍යම කොට්ඨාශයේ (ඉහළ) සහකාර පළාත් පාලන කොමසාරිස්, ධම්සේන අලුවිහාරේ වන මා විසින් 1966 ඔක්තෝබර් මස 27 වන දින පෙරවරු 10.30 ට, මාතලේ උඩසිය පත්තු ගම්සභා කායතිලයේ දී, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උඩසිය පත්තු ගම්සභාවේ රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ධම්සේන අලුවිහාරේ,
මධ්‍යම (ඉහළ) කොට්ඨාශයේ
සහකාර පළාත් පාලන කොමසාරිස්.

1966 ඔක්තෝබර් මස 10 වැනි දින,
මාතලේ පාළාත් පාලන කායතිලයේ දීය.

10–599—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## තනතුරු — ඇබැර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවසථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අතික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකාර සමාගමක් මඟින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මඟින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවසිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

## ——————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ————.

(ආ) ඉල්ලුම් කර ඇති තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන් කිසිවට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ සථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ තවතත් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය: ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—

සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—— ——.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මඟින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය
### යාන්ත්‍රික ශිල්පී (විදුලිය උපකරණ) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,170—42×12—රු. 1,674.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—1966. 11. 1 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි. උප්පැන්න සහතිකයේ පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතුයි. පළාත් පාලන සේවා සාමාජිකයින් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

(ආ) පහත සඳහන් වැඩ වල යටත් පිරිසෙයින් 10 අවුරුද්දක පළපුරුද්දක් ඉල්ලුම් කරුවන්ට තිබිය යුතුය.

(i) විදුලිය මෝටර්වල ජලය ඇතුළුවන ප්‍රධාන මාර්ග, රසායනික මාත්‍රා යන්ත්‍ර, වැකුම් පොම්ප මෝටර්, 5 ඇම්. ජී. බී. ස්ථානයෙහි පිල්ටර් මෝටර්, වායු ධමනි කර යන්ත්‍ර, ප්‍රධාන වතුර පොම්ප, මෝටර් සහ ස්වයංක්‍රිය ස්විච් යතුරු පුවරු ඇතුළුව එම යන්ත්‍ර වල යතුරු පුවරු, යන මේවා අළුත්වැඩියා කිරීම සහ නියමිත සර්විස් කිරීම.

(ii) සම්පස්ත යන්ත්‍ර සහ හයිලෙවල් පොම්ප යන්ත්‍ර වල එවැනි උපකරණ සවිකිරීම.

(iii) ඩයිනමෝ සහ සම්පස්ථ පිළියම් ස්ථානවල ස්විච් යතුරු ගියර් අළුත්වැඩියා කිරීම හා සර්විස් කිරීම.

(iv) ප්‍රධාන පොම්පය එම්. ජී. බී. 5. ප්‍රතිකර්ම ස්ථානය, සම්පස්ථ ප්‍රතිකර්මස්ථානය, සහ හයිලෙවල් පොම්ප කරන ස්ථානය යන තැන්වල අභ්‍යන්තර විදුලි කම්බි යෙදීම.

(v) යෝජනා ක්‍රමයට අදාළ අතිශක්මත් අතුරු ස්ථානවල දෝෂ වාර්තා කිරීම සහ සර්විස් කිරීම.

(ඇ) සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඉල්ලුම් පත්‍රය සමඟ එවිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966. 11. 1 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව, මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත්පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක්, ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 ඔක්තෝබර් මස 11 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

10–469—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය
### III වැනි ශ්‍රේණියේ යාන්ත්‍රික රියැදුරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 918—13×42—රු. 1,464. වර්ෂයකට රු. 1,296 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම.

3. අවශ්‍ය සුදුසුකම්—

(අ) වයස : 1966 නොවැම්බර් මස 1 දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ සිංහල/දෙමළ 7 වැනි පන්තියෙන් සමත් වී සිටිය යුතු අතර, ඉංග්‍රීසි පිළිබඳ ක්‍රියාකාරි දැනුමක් තිබිය යුතුයි. විදුලිබල මධ්‍යස්ථානයක හෝ ඉංජිනේරු කර්මාන්ත ශාලාවක වැද්දුම්කරුවන් සහ එන්ජින් යාන්ත්‍රිකයන් වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක සේවයක් හෝ එම තත්ත්වයේ සැපයීම් ආයතනයක ඒ හා සමාන කාල සීමාවක පළපුරුද්දක් ඔවුනට තිබිය යුතුයි. ස්ට්‍රෝක් 2 සහ 4, ඩීසල් එන්ජින් ක්‍රියා කරවීම සහ එවායේ ක්‍රියාකාරි මූලධම් පිළිබඳ සෑහෙන දැනුමක් ඔවුනට තිබිය යුතු අතර, සමාන්තර ක්‍රියාකාරිත්වයක යෙදෙන ධාවන යන්ත්‍ර ද ඇතුළුව අවශ්‍ය ප්‍රතිසංස්කරන කිරීමේ හැකියාව තිබිය යුතුයි. පළපුරුද්ද පිළිබඳව ලත් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1966 නොවැම්බර් මස 1 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

උප්පැන්න සහතිකයේ හා අනෙක් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම් පතට අමුනා එවිය යුතුයි. මේ ලියවිලිවල පිට පත් නොමැතිව එවන අයදුම් පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවෙ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමනි.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින් තමන් පත්කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචි වීමට අවශ්‍ය විය හැක.

9. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 සැප්තැම්බර් මස 29 දින,
තැ. පෙ. 530,
කොළඹ.

10–452—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### පොදු සෞඛ්‍ය සේවිකා තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාරුකර යැවීමට හැකිය.

2. වැටුප.—තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය (1) වර්ෂයකට රු. 2,220 න් පටන් ගෙන, වර්ෂයකට රු. 120 බැගින් 10 වරක් වැඩිවී, රු. 3,420 දක්වා නගී. එහි රු. 2,820 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි. මේ වැටුප් ක්‍රමය පහත 3 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ඇති පුහුණු වූ පොදු සාත්තු සේවිකාවන් සඳහාය.

2. වර්ෂයකට රු. 1,320—72×12—රු. 2,184 වැටුප් ක්‍රමය.—එහි රු. 1,608 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. මේ වැටුප් ක්‍රමය පහත 3 (ආ) (ඇ) ඡේදවල සඳහන් සුදුසුකම් සහිත සේවිකාවන් කෙරෙහි අදාළ වෙයි.

තෝරාගනු ලබන අපේක්ෂිකාවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔවුනට අදාල වැටුප් ක්‍රමයෙහි සුදුසු පියවරක පිහිටුවනු ලබති.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය, වින්නඹු සේවිකා සහතිකය සහ පොදු සෞඛ්‍ය සේවිකා සහතිකය,

හෝ

(ආ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය සහ වින්නඹු සේවිකා සහතිකය, හෝ

(ඇ) සාමාන්‍ය සාත්තු සේවිකා සහතිකය සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි).

4. අපේක්ෂිකාවන්ට පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලවල මගින් නොමිළයේ නිළ ඇඳුම් සපයනු ලැබේ. ඒ ප්‍රාදේශීය බලමණ්ඩලවල සීමාවන් ඇතුළත පදිංචි වන ලෙස ඔවුනට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදශී ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1966 නොවැම්බර් මස 1 වැනි දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘතියෙහි 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි.

**විශේෂ සුදුසුකම් :—**

(1) සාත්තු සේවය පිළිබඳ ඇති සුදුසුකම්වල විස්තර.

(2) පුහුණුවූ පොදු සෞඛ්‍ය සාත්තු සේවිකාවන්ද යනු.

(3) වින්නඹු කර්මය පිළිබඳ පුහුණුව ලබා තිබේද ?

7. අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. අවශ්‍ය සාත්තු සේවිකා සහකතිවල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක්ද නොමැතිව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පානායතනයක නාගරික කොමසාරිස් වරයා හෝ සභාපති වරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විනසි ඒවා පිළිගන්නා ලෙස නිරේද්ශ කළහොත් පමණී.

1. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දින සිට සති 2 ක කාලයක් ඇතුළතදී සුදුසුකම් ඇති අයදුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ඔක්තෝබර් මස 2 දින,
තැ. පෙ. 530, කොළඹ.

10–432—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### සන්ත්‍රාගාර ධාවක තනතුර—පශු වෛද්‍ය දෙපාර්තමේන්තුව

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවයි. තෝරාගන්නා ලද අයදුම්කරුවා පළමුවරට කොළඹ නාගරික සභාවට පත්කරනු ඇත.

**2. වැටුප.—තනතුරට අදාල වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 1,620—120×16—රු. 3,540. එහි රු. 2,700 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි.**

3. **අවශ්‍ය සුදුසුකම්—**

(අ) වයස : 66.11.1 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාග සමත්වී සිටිය යුත්තාහ:—

(i) ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ

(ii) දෙවරකට අධික නොවන වාර ගණනකදී, සිංහල හෝ දෙමළ ගණිතය, භෞතික විද්‍යාව රසායන විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සාමාර්ථ්‍යය ලැබූ අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙල)

(ඇ) ලංකා කාර්මික විද්‍යාලය විසින් නිකුත් කරනු ලබන කර්මාන්ත ශාලා පරිචය පිළිබඳ සහතිකය, හෝ පිළිගත් වෙළඳ සමාගමක ආණ්ඩුවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කර්මාන්තශාලා පරිචයක් ඉල්ලුම්කරුවනට තිබිය යුතුය.

4. මෙම ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසේ ආරම්භයෙහි පළකරන තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීමේ සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදශී ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට ඇති 66.11.11 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේමා වෙත එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

7. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 ඔක්තෝබර් මස 2 දින,
තැ. පෙ. 530, කොළඹ.

10–471—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**4 වැනි ශ්‍රේණියේ ලේකම්වරුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1966. 5. 10**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයා ඔහුගේ නමට ඉදිරියෙන් දී ඇති විෂයයෙන් සමත්වී ඇති බැව් මෙයින් දන්වනු ලැබේ.

| නම | ප්‍රාදේශීය බලමණ්ඩලය |
|---|---|
| 1. ජයසිංහ, ඩී. ඊ. ... | තිස්සමහාරාම සුළු නගර සභාව. |

**සමත් වූ විෂයය**

පළාත් පාලන ආයතන ගිණුම්.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 ඔක්තෝබර් මස 3 දින,
තැ. පෙ. 530, කොළඹ.

10-461—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**පහළ ශ්‍රේණියේ ලඝුලේඛකයින්ගේ (ඉංග්‍රීසි) පත්වීම ස්ථිර කිරීමේ විභාගය**

අංක ඩී. 99 සහ 1964 නොවැම්බර් මස 9 වැනි දින දරන චක්‍රලේඛ ලිපියේ ප්‍රකාර පහත සඳහන් අපේක්ෂිකාව, ඉහත සඳහන් විභාගයේ "සිංහල" විෂයයට පෙනී සිටීමෙන් නිදහස් කර ඇත.

* එච්. ඕ. ද සිල්වා,
ඉංග්‍රීසි ලඝුලේඛිකා,
කොළඹ නාගරික සභාව.

* විභාගය සම්පූර්ණ කර ඇත.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 ඔක්තෝබර් මස 3 දින,
තැ. පෙ. 530, කොළඹ.

10-460—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී 108/34

## මඩකලපුව නගර සභාව

**නගර සභා ආඥාපනත**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 හා 157 වැනි වගන්ති යටතේ මඩකලපුව නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1966. 9. 26.

## අතුරු ව්‍යවස්ථාව

1963 මාර්තු 15 වැනි දින අංක 13,564 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථාවල "රෙදි අපුල්ලන ස්ථානයක් පැවැත්වීම" යන විෂයට ඉක්බිතිව ම "සිමෙන්ති ගබඩා කිරීම" යන අළුත් විෂය එකතු කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10-459—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී 22/50

## තෙල්දෙණිය සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ තෙල්දෙණිය සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා වයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් 20 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථා

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන 1966 වැනි වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මීට යාකොට ඇති උපලේඛනයේ විස්තර කැරෙන ස්ථානයන් නිදහස් කළ යුතුය.

**උපලේඛනය**

පහත සඳහන් වරිපනම් අංක දරන ස්ථාන :—

**අංක 4 දරන ඡන්ද කොට්ඨාශය**

නුවර පාර : 8.
ඌරුගල පාර : 60.

**අංක 5 දරන ඡන්ද කොට්ඨාශය**

රංගල පාර—අංක. 84, 88, 88/1, 88/3, 88/5, 108/2 සහ 108/4.

ඌරුගල පාර—අංක. 21, 21/2, 21/3, 21/4, 21/6, 79, 79/1, 79/2, 79/3, 79/4, 79/5, 85, 85/1, 85/2 සහ 85/5.

10-458—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 72/50.
ප. පා. දෙ. ජීඒ. 19/47

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතෙන් සංශෝධිත (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, මන්නාරම් දිස්ත්‍රික්කයේ එරුක්කලම්පිඩ්ඩි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ එකී වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 9. 26 දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථා

**අප්‍රසන්න සහ අන්තරාදායක ව්‍යාපාර**

1964 ජනවාරි මස 17 වැනි දින අංක 13,924 දරන ගැසට් පත්‍රයේ පළවූ අප්‍රසන්න සහ අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 3 වැනි ඡේදයෙහි (4) කරුණට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් කරුණ, එනම් :—"(5) හාල් මෝලක් පවත්වාගෙන යාම" යන්න යෙදීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10-444—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 72/47.

## බෙලිඅත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ බෙලිඅත්ත සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා වයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 20 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ අය කරනු ලබන්නාවූත්, 1966 පෙබරවාරි 3 වෙනි දින අංක 14,653 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1966 ජනවාරි 25 වෙනි දින දරන දන්වීමේ සඳහන් වූත්, 1966 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මීට යාකොට ඇති උපලේඛනයේ විස්තර කර ඇති ස්ථානයන් නිදහස් විය යුතුය.

### උපලේඛනය

පහත දක්වෙන වරිපනම් අංක දරන ස්ථාන :—

#### අංක 1 දරන ඡන්ද කොට්ඨාශය

අරන්වෙල පාර—අංක. 9/5, 9/7, 9/8, 9/11, 9/12, 9/13, 9/14, 9/15, 9/16, 29 සහ 31.

වලස්මුල්ල පාර—අංක. 100, 100/2, 100/3, 100/4, 114, 114/2, 114/3, 114/4, 126, 126/1, 126/3, 132, 132/2, 136, 138 සහ 138/2.

#### අංක 2 දරන ඡන්ද කොට්ඨාශය

අරන්වෙල පාර—අංක. 28, 28/1, 40/4, 40/5, 46/2, 46/3, 50, 50/1, 56, 56/1, 56/2, 64, 66, 66/1, 66/2, 66/5, 66/6, 66/8, 66/9, 66/10 සහ 66/11.

දුන්වතුගොඩැල්ල පාර—අංක. 9, 15, 19, 19/1, 19/3, 19/7, 19/9, 19/10, 19/11, 19/14, 19/15, 19/16, 19/18, 10, 16, 18, 28, 28/1, ඉලුක්මුල්ල පාර—අංක. 20, 22, 32, 46.

පාලුවත්ත පාර—අංක. 11, 11/1, 19, 21, 23, 25/5, 6/1, 6/3, 6/4, 6/5, 8, 10, 12, 14, 18, 18/1, 20, 22, 24, 26, සහ 26/1.

තංගල්ල පාර—අංක. 109, 109/1.

වින්සන්ට් පාර—අංක. 24/3, 24/4, 24/5, 24/6 සහ 34.

වීර සිංහ පාර—අංක. 29/3, 29/4, 29/5, 29/7, 31, 41, 47, 51,57, 59/2, 59/3, 63, 63/1, 63/2, 63/3, 63/4, 63/5 සහ 63/6.

#### අංක 3 දරන ඡන්ද කොට්ඨාශය

දික්වැල්ල පාර—අංක. 69/3, 69/4, 69/5, 69/6, 69/7, 69/8, 89/13, 89/16, 89/20, 89/21, 89/22, 89/23, 89/24, 89/28, 89/29, 89/32 සහ 89/34.

තංගල්ල පාර—අංක. 118/2, 118/3, 118/5, 118/5A, 118/5B, 118/5C, 118/5D, 118/5E, 118/6, 118/7, 118/8, 118/8A සහ 138/7.

#### අංක 4 දරන ඡන්ද කොට්ඨාශය

දික්වැල්ල පාර—අංක. 161, 161/1, 163, 163/1, 74, 74/3–4, 74/8, 156, 158, 158/1, 172 සහ 178.

ගැටමාන්න පාර—අංක. 29/1, 29/2, 29/3, 29/4, 37, 43, 45, 45/8, 45/9, 45/10, 45/12, 45/13 සහ 49.

ජූල්කැටිය පාර—අංක. 8/3, 8/3A, 8/4, 8/5, 8/6, 18, 24, 24/1 24/2, 24/3, 24/4, 26, 30, 30/1, 30/2, 30/3, 36, 36/1, 36/2, 42, 42/1 44, 44A, 44/1, 44/2, 44/3, 44/4, 50 සහ 50/1.

කොට්ගොඩැල්ල පාර—අංක. 8, 10, 16, 16/2, 16/4 සහ 16/8.

#### අංක 5 දරන ඡන්ද කොට්ඨාශය

දික්වැල්ල පාර—අංක. 44/3, 44/4, 44/5, 44/6 සහ 44/7.

ගැටමාන්න පාර—අංක. 16/4, 16/5, 16/6, 16/7, 16/8, 16/11, 16/12, 16/15, 26, 26/5, 26/6, 32/1, 40 සහ 40/1.

හක්මන පාර—අංක. 113.

කම්බුරුගමුවෙල පාර—අංක. 15, 15/2, 12, 16, 18, 18/1, 22, 28, 28/4, 28/5, 32, 36, 36/3, 42, 42/1, 46 සහ 46/2.

#### අංක 6 දරන ඡන්ද කොට්ඨාශය

දෙවුන්දර ගොඩ පාර—අංක. 3, 17, 19 සහ 29.

හක්මන පාර—අංක. 72/10, 86/5, 86/6.

10–457— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී—බී 58/52.

ප. පා. දෙ.—ජී.අයි. 9/4

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරණ වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966. 9. 26 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

1956 අගෝස්තු මස 17 වැනි දින, අංක 10,962 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයෙන් කොසොන්සියපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල xxviii වන කොටසෙහි දක්වෙන ජල සම්පාදන සේවය පිළිබඳ අතුරු ව්‍යවස්ථා, එහි 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) වෙනි ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (ඇ) කිසිවකු විසින්, පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සපයන ලද වතුර පයිප්පයකින් ජලය නාස්තිවී යන යම් ආකාරයකට හෝ ප්‍රමාණයකට වතුර නො ගත යුතු ය."

10–427—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

ඇල්. සී—සී 292/41

ප.පා.දෙ—ජී. ඒ. 19/58

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ වන්කාලෙයි ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1966 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

**අන්තරායදායක ව්‍යාපාර සහ අප්‍රසන්න ව්‍යාපාර**

1. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු ය :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
තොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
මිශ්‍ර පොහොර හෝ කෘතිම පොහොර හෝ සෑදීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
පුවක් වියලා සකස් කිරීම.
සතුන්ගේ ලේ හෝ අතුණුබහන් උණු කිරීම.
හම් ගබඩා කිරීම.
සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
මාළු අයිස් දැමීම.
ලැලි පොගවා සකස් කිරීම.
රබර් ෂීට් හෝ ක්‍රෙප් රබර් දුම් ගැසීම සහ සෑදීම.
කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
කෝඩා සෑදීම.
දුම්කොල වියලා සකස් කිරීම.
සුරුට්ටු සෑදීම.
පැණි සෑදීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
බීඩි සෑදීම.

2. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා සෑදීම.
කබුක්, බොරළු හෝ තළුගල් සඳහා වලවල් කැණීම.
කොප්පරා ගබඩා කිරීම.
පිදුරු ගබඩා කිරීම.
කපාපු පොල් සෑදීම.
මිණිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම.
කපාපු පොල් සෑදීම.
වළක් කැනීමෙන් හුනුගල් ලබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් සිඳීම.
සෙක්කුවෙන් පොල් තෙල් සිඳීම.
පැඟිරිතෙල් නිෂ්පාදනය.
කුරුඳු තෙල් නිෂ්පාදනය.
කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
කපු පුළුන් ගබඩා කිරීම.
දැව ගබඩාවක් හෝ දර ගබඩාවක් පවත්වාගෙන යාම.
ස්වර්ණාභරණ සෑදීම.
කම්මලක් පවත්වාගෙන යාම.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
අම්ලකර පෑස්සීමෙන් කම්මල් වැඩ කරන යම් ව්‍යාපාරයක්.
හාල් මෝලක් හා ඇඹරුම් මෝලක් පවත්වාගෙන යාම.
පට්ටලයක් පවත්වාගෙන යාම.

3. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කෙඳි වර්ග සායම් කිරීම.
ගඩොල් හෝ උළු පිළිස්සීම.
බැටරි පිරවීම.
හුණු පිළිස්සීම, ගබඩා කිරීම, පදම් කිරීම හෝ කැබලි කිරීම.
පොල් ලෙලි පෙඟවීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.
සිසිල් බීම සෑදීම.

10–435—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### බණ්ඩාරවෙල නගර සභාව

**නගර සභා රෙගුලාසි අංක 12 (ii) යටතේ ඉල්ලීමයි**

### 1966 අය-වැය වාර්තාව

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් වැය ශීර්ෂයේ මුදල් වැඩිපුර වියදම් යටතේ සඳහන් වැය ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට වර්ෂ 1966 සැප්තැම්බර මස 27 වැනි දින පැවැති සභා රැස්වීමේදී අංක 15 දරණ යෝජනාවෙන් සම්මත කරන ලදි.

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඊ. (ජී) කසල කාණු සෑදීම | ... ... | 2,525 | 0 |
| | එකතුව ... | 2,525 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ. 2(ඒ) | අතිරේක දීමනා | ... ... | 350 | 0 |
| ඒ. 4 | දයක මුදල් හා ආධාර මුදල් | ... ... | 100 | 0 |
| සී. 3 | බදු ඉඩම් කුලිය ... | ... ... | 200 | 0 |
| ඊ. 7 (එච්) | ජීවන වියදමට දෙන මුදල් | ... ... | 325 | 0 |
| ඇෆ්. 6 | විනෝද බදු පරීක්ෂක දීමනා | ... ... | 550 | 0 |
| ඇෆ්. 7 | ජීවන වියදමට දෙන මුදල් | ... ... | 500 | 0 |
| ඇම්. 2 | පොත් පත්, සඟරාවල් | ... ... | 500 | 0 |
| | | එකතුව ... | 2,525 | 0 |

ජී. කේ. ලියනගේ,
සභාපති,
නගර සභාව, බණ්ඩාරවෙල.

1966 ඔක්තෝබර් මස 1 වැනි දින,
බණ්ඩාරවෙල නගර සභා කාර්යාලයේ දී ය.

10–433—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## පිළියන්දල උප නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය වැය ලේඛණය

### 1 කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය |
|---|---|---|
| ඒ. 2(ජී)—කරත්ත සහ (බෝට්ටු) කහවු මිළ ... ... ... ... ... | 6 0 | ... 66. 1. 3—අංක 5 |
| ඒ.2 (ඇල්)—මුදල් රක්ෂණය ... ... ... ... ... ... | 10 0 | ... 66. 8.13—අංක 5 |
| ඒ. 4—ආධාර හා දීමනා ... ... ... ... ... ... | 50 0 | ... 66. 1. 3—අංක 7 |
| | 50 0 | ... 66. 4. 5—අංක 19 |
| | 50 0 | ... 66. 8.13—අංක 9 |
| | 150 0 | ... 66. 9. 7—අංක 29 |
| බී. 12—අළුත් වැඩ ... ... ... ... ... ... | 175 0 | ... 66. 2. 7—අංක 15 |
| | 491 0 | |

එච්. ඩී. සී. විජේනන්දන,
සභාපති,
පිළියන්දල උප නගර සභාව.

1966 සැප්තැම්බර් 26 වැනි දින,
පිළියන්දල උප නගර සභා කාර්‍යාලයේදිය.

10–451—16.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත සුළු නගර සභාව

### මුදල් නීති රෙගුලාසි අංක 40(ii) යටතේ අයදුම් පත

### වර්ෂ 1966—අය වැය කෙටුම් පත

1966 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේ යයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරු කොට අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1966 සැප්තැම්බර් මස 19 වැනි දින මාසික සභා රැස්වීමේ යෝජනා අංක 8 අනුව සභා සම්මත විය.

### 1 කොටස—සාමාන්‍ය

| ඉතිරි මුදල් වැය ශීර්ෂ | රු. ශ. | වැඩිපුර වියදම් වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—2 (සී) බදු එක්කාසු කරන්නාට කොමිස් ... | 600 0 | ඒ.—1 (බී) ලිපිකරුවෝ ... ... ... | 140 0 |
| ඒ.—2 (කේ) කාර්යාලිය බඩු බාහිරාදිය ... ... | 150 0 | ඒ.—2 (ඒ) දීමනා ... ... ... | 430 0 |
| ඞී.—1 (එච්) කාණු දීර්ඝ කිරීම ... ... | 300 0 | ඒ.—2 (බී) ගමන් ගාස්තු ... ... ... | 650 0 |
| ඞී.—2 (ඊ) ජීවනාධාර ... ... ... | 1,800 0 | ඒ.—2 (ඇෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ගාස්තු ... ... | 200 0 |
| ඒ.—3 (ජී) එත් වැඩ ... ... ... | 800 0 | බී.—(4) වීථි ආලෝක කිරීම ... ... | 600 0 |
| ඞී.—5 (ඊ) ෟාල දීර්ඝ කිරීම ... ... | 750 0 | සී.—(1) වැටුප් ... ... ... | 150 0 |
| | | ඞී.—2 (බී) කරත්ත ගොනුන් හා ලොරි ... ... | 300 0 |
| | | ඞී.—3 (බී) කරත්ත ගොනුන් හා ලොරි ... ... | 200 0 |
| | | ඞී.—3 (එච්) ජීවනාධාර ... ... ... | 150 0 |
| | | ඞී.—5 (ඒ) වැටුප් ... ... ... | 400 0 |
| | | ඞී.—5 (බී) බඩු බාහිරාදිය ... ... | 400 0 |
| | | ඞී.—5 (සී) නඩත්තුව ... ... ... | 520 0 |
| | | ඞී.—5 (අයි) ජීවනාධාර ... ... ... | 140 0 |
| | | ජේ.—(3) පොත් පත් හා සහරා ... ... | 120 0 |
| එකතුව ... | 4,400 0 | එකතුව ... | 4,400 0 |

### 2 කොටස—විදුලි අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| ඊඩී.—(10) ජීවන වියදම් ... ... ... | 600 0 | ඊඩී.—1 (බී) එන්ජින් තෙල් හා බඩු ... ... | 600 0 |
| | 600 0 | | 600 0 |

ඩබලිව්. පී. සයිමන් සිල්වා,
සභාපති,
බෙලිඅත්ත සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 24 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බෙලිඅත්ත.

අනුමත කරන ලදී.

ඇම්. ඇල්. ඇම්. පෙරේරා,
පළාත් පාලන සහකාර කොමසාරිස්, පහළ දකුණු දිශාව.

1966 ඔක්තෝබර් මස 4 වැනි දින,
මාතර.

10–463—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## මොණරාගල සුළු නගර සභාව

### දෙවැනි අතිරේක අය වැය ලේඛණය--1966 වර්ෂය

| වියදම් ශීර්ෂය | ගණන් බලන ලද වියදම් රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) නිලධාරි වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 65 | 0 |
| (2) සංස්ථා වියදම්— | | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශන හා කාර්යාලීය වියදම් ... | 200 | 0 |
| (3) ආපසු ගෙවීම් ... ... ... | 291 | 21 |
| බී.—මංමාවත් :— | | |
| (1) වැටුප් හා කුලී— | | |
| (සී) කුලීකරුවෝ ... ... ... | 300 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඇෆ්) විශනාශක ද්‍රව්‍ය ... ... | 15 | 0 |
| (2) කැලි කසල— | | |
| (ඒ) කුලී ... ... ... | 100 | 0 |
| (3) මළ ප්‍රවාහන— | | |
| (සී) ගබඩා ... ... ... | 25 | 0 |
| | 996 | 21 |

වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 15 වැනි දින පැවැත්වූ මාසික රැස්වීමේ දී ඌවේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගේ සංශෝධනයට ඉඩ ඇතිව සභාව පිළිගනිමින් සම්මත කරන ලදී.

ආර්. ජේ. ලෙනෝරා,
සභාපති,
මොණරාගල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මොණරාගල,
1966 සැප්තැම්බර් මස 25 වැනි දින.

අනුමත කරමි.

ඇම්. බී. සමරකෝන්,
ඌවේ සහකාර පළාත් පාලන කොමසාරිස්.

1966 ඔක්තෝබර් මස 4 වැනි දින,
බදුල්ල.

10–464—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## මාවනැල්ල සුළු නගර සභාව

### සුලු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(ii) වැන්න යටතේ අයදුම් පත

### 1966 වර්ෂයේ අතිරේක අය-වැය ලේඛනය

1966 වර්ෂයේ අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත සඳහන් ශීර්ෂ යටතේ පෙන්වා දී ඇති මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරු කිරීමට අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීම 1966 සැප්තැම්බර් මස 11 වෙනි දින පවත්වන ලද සභා රැස්වීමේ අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| ඉතිරිවීමේ වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| 3. පොත් පත් හා සඟරා ... ... | 1,000 | 0 |
| 4. දූව භාණ්ඩ ... ... ... | 547 | 36 |
| 5. නඩත්තුව ... ... | 5,000 | 0 |
| | 6,547 | 36 |

| වැඩිපුර අවශ්‍යව ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| ඒ. 1. බී. ලිපිකරු වැටුප් ... ... | 725 | 0 |
| ඒ. 1. සී. ආදායම් ප. ... ... ... | 185 | 56 |
| ඒ. 1. ඩී. කා. කා. ස. ... ... | 126 | 48 |
| 1. ඇප්. විශ්‍රාම වැටුප් ... ... | 700 | 0 |
| සංස්ථා වියදම් :— | | |
| 2. ඇප්. ලිපිද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශන සහ මුද්දර ගාස්තු ... | 1,000 | 0 |
| 2(ජේ). හදිසි වියදම් ... ... ... | 200 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 1. බී. පාලකවරු ... ... ... | 160 | 32 |
| 1. සී. කම්කරුවෝ ... ... ... | 100 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 1. දෛනික වැටුප් ... ... ... | 100 | 0 |
| 8. ජීවනාධාර ... ... ... | 100 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| 2. කැලිකසල ශෝධක—(ඒ) දෛනික වැටුප් ... | 800 | 0 |
| 5. සී. නඩත්තු කිරීම ... ... | 1,900 | 0 |
| 6. ඒ. දෛනික වැටුප්, ආයුර්වේද ... ... | 200 | 0 |
| 6. ඩී. ජීවනාධාර ... ... ... | 250 | 0 |
| | 6,547 | 36 |

ඒ. ඇල්. ඇම්. යූසුප්,
සභාපති,
සුලු නගර සභාව, මාවනැල්ල.

1966 සැප්තැම්බර් මස 17 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

ඇල්. ජී. සිරිවර්ධන,
සහකාර පළාත් පාලන කොමසාරිස්
(සබරගමු පෙදෙස).

1966.9.30,
පළාත් පාලන කාර්යාලය, රත්නපුර.

10–440—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## රත්කොට සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(1) යටතේ අයදුම්පත**

1966—අයවැය ලේඛණය—සවන පූරකවැය

**සාමාන්‍ය කොටස**

| වැය ශීර්ෂය | සම්මත මුදල රු. ශ. | සභා සම්මුතිය හා දිනය |
|---|---|---|
| බී—මංමාවත් | | |
| 4—වීථි ආලෝක කිරීම ... | 250 0... | 1966.10. 1 දින, අංක 1 |

**විදුලිය කොටස**

| වැය ශීර්ෂය | සම්මත මුදල රු. ශ. | සභා සම්මුතිය හා දිනය |
|---|---|---|
| 6—ව්‍යාප්තිය හා සංවර්ධනයෝ | 4,600 0... | 1966.10. 1 දිනට අංක 1 |

ඩබ්ලි . එච්. ද සිල්වා,
සභාපති, රත්තොට සුළු නගර සභාව

1966.8.22 දින,
රත්තොට සුළු නගර සභා කායර්‍යාලයේදීය.

10–436—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## මිනුවන්ගොඩ සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ කෙරෙන අයදුම් පතයි**

අයවැය ලේඛනය 1966

1966 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේවූ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 26 වන දින පැවැත්වුනු මාසික සභා රැස්වීමේ අංක 12 දරණ යෝජනාවෙන් සභා සම්මත වී තිබේ.

**1 කොටස—සාමාන්‍ය**

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. ශ. | වැඩිපුර මුදල් වැය ශීර්ෂය | රු. ශ |
|---|---|---|---|
| ඒ.—2 (බී) කා. ම. ගමන් ගාස්තු ... ... | 250 0 | ඒ.—1(බී) සේවක වැටුප් ලිපිකරු ... ... | 200 0 |
| බී.—2 මහාමාර්ග නඩත්තු කිරීම ... ... | 1,000 0 | ඒ.—1(ඩී) සේවක වැටුප් පියන්වරු ... ... | 100 0 |
| සී.—4 න. ස. ගොඩනැගිලි නඩත්තු ... ... | 500 0 | ඒ.—2(ඒ) කා. ම. වියදම්, ආධාර ... ... | 150 0 |
| ඩී.—2(ඒ) කසලශෝධක වේතන ... ... | 500 0 | ඒ.—2(ඇෆ්) කා. ම. වියදම් ලිපි ද්‍රව්‍ය ... ... | 500 0 |
| | | ඩී.—2(බී) ක. ශෝ. කර. ගො. ලො. ... ... | 300 0 |
| | | ඩී.—7(ඩී) වෙළඳසැල් ඉදිකිරීම ... ... | 1,000 0 |
| එකතුව ... | 2,250 0 | එකතුව ... | 2,250 0 |

**2 කොටස—විදුලිය**

| | | | |
|---|---|---|---|
| ඊ.ඇල්.—4(ඒ) පරිපාලක වේතන ... ... | 1,750 0 | ඊ.ඇල්.—4(බී) සංචා. සේවක වේත. ... ... | 250 0 |
| | | ඊ.ඇල්.—4(සී) මුද්‍රණ ලිපිද්‍රව්‍ය ආදිය ... ... | 500 0 |
| | | ඊ.ඇල්.—6 දීර්ග කිරීම් වා.දි.කි. ... ... | 1,000 0 |
| එකතුව ... | 1,750 0 | එකතුව ... | 1,750 0 |

ඩී. ඩී. විජේතුංග,
සභාපති,
මිනුවන්ගොඩ සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 30 වන දින,
මිනුවන්ගොඩ සුළු නගර සභා කායර්‍යාලයේදී.

10–429—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## මහරගම නගර සභාව

**මුදල් පරිහරන නීති පොතේ අංක 40(2) යටතේ අයදුම් පත.**

අයවැය කෙටුම් පත

ශීර්ෂවල ඉතිරි වී ඇති මුදල් ඒ ප්‍රමාණයන් අනුව වැඩි වී ඇති ශීර්ෂවලට යෙදවීම 1966.9.29 වෙනි දින සභා රැස්වීමේ අංක 4 දරණ යෝජනා ස්ථිත්වය අනුව පහත සඳහන් අන්දමට සභා සම්මත කරන ලදී.

**1 වෙනි කොටස—සාමාන්‍ය අංශය**

| ශේෂ | රු. ශ. | අතිරික්ත | රු. ශ. |
|---|---|---|---|
| බී 7—වන්දි මුදල් ... ... ... | 14,750 0 | ඒ 2—(සී) අයබදු අයකරන්නන්ගේ කොමිස් මුදල් ... | 1,000 0 |
| | | ඒ 2 (කේ) කාර්යාලයට අවශ්‍ය බඩු හා උපකරණ ... | 1,000 0 |
| | | ඒ 2—(එම්) අතිකාල දීමනා ... ... | 750 0 |
| | | බී 8 දියුණු කිරීම ... ... | 12,000 0 |
| | 14,750 0 | | 14,750 0 |

**11 වෙනි කොටස—විදුලිය අංශය**

| | | | |
|---|---|---|---|
| වි 6—විදුලි මාවත් දීර්ඝ හා දියුණු කිරීම ... ... | 200 0 | වි 4—(බී) අතිකාල දීමනා ... ... | 200 0 |

එච්. ජිනදස කල්දේරා,
සභාපති (වැඩ බලන),
මහරගම සුළු නගර සභාව.

සුළු නගර සභා කායර්‍යාලය,
මහරගම, 66.10.8

10–513—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## හැඳල සුළු නගර සභාව

මගේ අංකය ; සී2.

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1967 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හැඳල සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උප ලේඛනය

| නො. | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳමේ විස්තර | ස්ථානය |
|---|---|---|---|
| 1 | කේ. ඒ. පී. ඩී. රුද්‍රිගු, අඩි 20 පාර, වැලිසර, රාගම | එලහරක් මස්, එළුමස් සහ ඌරු මස් | හැඳල වේල්ල මස් කඩය |
| 2 | ඊ. පී. සරම්, ලෙනාඩ් සැළුන්, වත්තල | එම | නායකකන්ද මස් කඩය |
| 3 | ඇම්. පැලිස්, 40, වැලිඅමුණ, තිඹිරිගස්යාය | එම | ඇලකන්ද හන්දියෙ මස් කඩය |
| 4 | මාකොල විමලදාස, කිරලගස්දෙනිය, පල්ලියවත්ත | එම | ඇලකන්ද රා තැබෑරුම අසල මස්කඩය |
| 5 | කේ. ඒ. පොන්සේකා, මරදන පාර, මාටාගොඩ | එම | පල්ලියවත්ත පාලම අසල මස් කඩය |
| 6 | ඇම්. පැලිස්, 40, වැලිඅමුණ, තිඹිරිගස්යාය | එම | වැලිඅමුණ මස් කඩය |

ඇම්. ඩී. ලෝරන්ස්,
සභාපති,
හැඳල සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 30 වෙනි දින,
හැඳල සුළු නගර සභා කාර්යාලයේදී.

10–450—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අයවළුන් විසින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දැක්වෙන ස්ථානයේ 1967තේ වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලා ඉල්ලුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947තේ අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන ගලේවෙල සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම කරන ස්ථානය | වෙළඳම |
|---|---|---|
| 1. ඊ. බදූර්දීන් | පද්දකොටුව අංක 169/5, දඹුල්ල පාර | හරක් මස් |
| 2. ඊ. බදූර්දීන් | පද්දකොටුව අංක 169/4, දඹුල්ල පාර | එළු මස් |

ග. හේ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

සුළු නගර සභා කායයාීලය,
ගලේවෙල, 1966 ක්වූ ඔක්තෝබර් මස 1 වැනි දින.

10–443—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල සුළු නගර සභාව

### පිස් සු බලු උවදුර

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥාපනතේ II වැනි වගන්තිය ප්‍රකාර (333 වැනි පරිච්ඡේදය මොණරාගල සුළු නගර සභාවේ පාලන සීමා ඇතුලත පිහිටි කිසියම් ස්ථානයක පාරක හෝ තමන්ගේ නොවන ඕනෑම ස්ථානයක මිදුලක හෝ ඉඩමක නිසියාකාර නොබඳින ලද එසේ නොමැතිනම් භාරකරුවෙකු නොමැති බල්ලෙකු හෝ බැල්ලක දුටු වහාම මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලයලත් කිසියම් පුද්ගලයෙකු විසින් එවෙලේම විනාශකර දමනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1966 ඔක්තෝබර් මස 1 වැනි සිට 1966 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වලංගුවේ.

ආර්. ජේ. ලෙනෝරා,
සභාපති,
මොණරාගල සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 29 වැනි දින,
මොණරාගල සුළු නගර සභා කාර්යාලයේදීය.

10–441—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 වගන්තිය අනුව පහත උපලේඛනයේ විස්තරවන ගණන් අනුව 1967 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා ඇති බවත්,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1967 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවියයුතු බවත් මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| සෑම පා පැදියක් සඳහා | 1 00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 2 50 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් හෝ සඳහා | 4 00 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා | 2 50 |

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1966 ඔක්තෝබර් මස 1 වැනි දින.

10–438/1—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1967 වර්‍ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) යටතේ ගතවී යන 1966 වැනි වර්‍ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1967 වැනි වර්‍ෂයටද එලෙසම පැනවීමට බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන කුඹුරු අත්හැර සියළුම නිශ්වල දේපලවලට වාර්‍ෂික වටිනාකමින් සියයට පහ බැගින් වාර්‍ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1966 ඔක්තෝබර් මස 1 වැනි දින.

10–438/2— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව

### 1967 වර්‍ෂයේ සුනඛයන් ලියා පදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයන් ලියා පදිංචිකිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)

සුනඛයන් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 334 වැනි පරිච්ඡේදයේ 4 වැනි කොටසේ ප්‍රකාර බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා සීමාව තුල තබා ගන්නා සෑම බල්ලකු වෙනුවෙන් ශත 50 ක්ද බැල්ලියක් වෙනුවෙන් රු. 1 ක්ද, ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1966 වර්‍ෂයේදී මෙන්ම 1967 වර්‍ෂයේදීද පනවා ඇති බවද එකී ගාස්තු 1967 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

පී. හෙන්රි බොතේජු,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
බත්තරමුල්ල-තලන්ගම,
1966 ඔක්තෝබර් මස 1 වැනි දින.

10–438/3— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## ලුණුගල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

සුළු නගර සභා ආඥාපනතේ 161 හා 163 වගන්ති යටතේ, 1965.12.24 දින අංක 14,593 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ලුණුගල සුළු නගර සභාව විසින් පළ කරන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු පිළිබඳ උපලේඛනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

එම උපලේඛනයේ අවසානයට පහත සඳහන් කොටසද ඇතුලත් විය යුතුය.

| බලපත්‍රයේ ස්වභාවය | වාර්‍ෂික බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|
| 50. මෝටර් රථවලින් එළවළු ගෙනැවිත් සුළු නගර සභා සීමාව තුළ විකිණීම සඳහා බලපත්‍රයකට ... | 10 00 |

ඩබ්ලිව්. ඒ. පියදාස,
සභාපති වෙනුවට,
සුළු නගර සභාව, ලුණුගල.

1966 සැප්තැම්බර් මස 24 දින,
ලුණුගල සුළු නගර සභා කායාීලයයේදී.

10–434— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### 1967 වර්‍ෂයේ සුනඛයින් ලියාපදිංචි කරවීමේ ගාස්තුව

### සුනඛයින් ලියාපදිංචි කරවීමේ ආඥාපනත (334 වෙනි පරිච්ඡේදය)

සුනඛයින් ලියා පදිංචි කරවීමේ ආඥාපනතේ (334 වෙනි පරිච්ඡේදය) 4 වෙනි වගන්තියේ ප්‍රකාර වෙන්නප්පුව සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙක් හෝ බැල්ලියක් සඳහා ශත 50 බැගින් 1967 මාර්තු 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් පනවා අයකිරීමට තත් සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති.

1966.9.30,
සුළු නගර සභා කායාීලය,
වෙන්නප්පුව.

10–430/1— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් විකිණීමට 1967 වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව වෙන්නප්පුව සුලු නගර සභා සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට 14 දින ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතවූ 272 වන අධිකාරයේ අංක 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1966.9.30,
සුළු නගර සභා කායාීලය,
වෙන්නප්පුව.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| ඇම්. මේරි ජෝසපින් ප්‍රනාන්දු, උල්හිටියාව, වෙන්නප්පුව. | වෙන්නප්පුව පොදු වෙළඳපලේ අංක 1 දරණ හරක් මස් කඩය. |
| කේ. ඇප්. සී. කැලිස්ටස් පෙරේරා, උල්හිටියාව, වෙන්නප්පුව. | වෙන්නප්පුව පොදු වෙළඳපලේ අංක 2 දරණ එලු මස් කඩය. |
| කේ. ඇප්. සී. කැලිස්ටස් පෙරේරා, උල්හිටියාව, වෙන්නප්පුව. | වෙන්නප්පුව පොදු වෙළඳපලේ අංක 3 දරණ ඌරු මස් කඩය. |
| ඩබ්ලිව්. ජුවන් ප්‍රනාන්දු, මාරාවිල. | වෙන්නප්පුව රා තැබෑරුම අසල හරක්, එලු සහ ඌරු මස් කඩය. |
| ඇම්. ජී. මේරි ලිගෝරි ප්‍රනාන්දු, නුගගහමුල්ල, වෙන්නප්පුව. | වෙන්නප්පුව කොස්ගස් හන්දිය අසල හරක්, එලු සහ ඌරු මස් කඩය. |

10–430/2— 66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## වෙන්නප්පුව සුළු නගර සභාව

**1967 අවුරුද්ද සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

වෙන්නප්පුව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1967 වර්ෂයට රථ වාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද ;

(2) එකී ව්‍යවස්ථාවේ අංක 162 (3) යටතේ එකී බදු 1967 මාර්තු මස 31 වෙනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති.

1966.9.30,
සුළු නගර සභා කායසීලය,
වෙන්නප්පුව.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, රිකෂා රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම කරත්තයක් හෝ තිරික්කලයක් | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | 2 | 0 |
| තනි ගොනා බඳින සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | 2 | 0 |
| සෑම අශ්වයෙකුට, අශ්වතරයෙකුට හෝ පෝනියෙකුට ... | 2 | 50 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... | 0 | 50 |

10–430/3—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

**1967 අවුරුද්දට වරිපනම් බදු**

සුළු නගර සභා ආඥාපනතේ 256 වෙනි පරිච්ඡේදය යටතේ මෙම ගතවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1967 වර්ෂයටද එලෙසම පැනවීමට, වෙන්නප්පුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

159 වෙනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභාව තුළ පිහිටා තිබෙන සියලු නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) බැගින්වූ වාර්ෂික බද්ද දෙසැම්බර් 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවා අවසන් කළ හැකි අයුරිනි.

සිඩ්නි ජේ. ප්‍රනාන්දු,
සභාපති,
වෙන්නප්පුව සුළු නගර සභාව.

1966.9.30,
සුළු නගර සභා කායසීලය,
වෙන්නප්පුව.

10–430/4—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## බෙන්තොට සුළු නගර සභාව

**1967 අවුරුද්දට වරිපනම් බදු**

### සුළු නගර සභා ආඥාපනතේ 256 පරිච්ඡේදය

සුළු නගර සභා ආඥාපනත (256 වෙනි පරිච්ඡේදය) යටතේ මෙම ගතවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් බදු එලෙසම පැනවීමට නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

159 වෙනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා බලමණ්ඩලය තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට (6) බැගින් වාර්ෂික බදු පිළිවෙළින් ජූනි මස 30 වෙනිදායින් හා දෙසැම්බර් මස 31 වෙනිදායින් අවසන් වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි අයුරිනි.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් 2 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බෙන්තොට.

10–428/1—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## බෙන්තොට සුළු නගර සභාව

**1967 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

බෙන්තොට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1967 වැනි වර්ෂයට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද, එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1967 ජූනි මස 30 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අදුරින්ද වේ.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1966 ඔක්තෝබර් 2 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
බෙන්තොට.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| හැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 | 0 |
| (බී) වෙළඳාමට හැර වේනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 5 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |
| සෑම ඇතෙකුට හෝ ඇතින්නියකට ... ... | 15 | 0 |

10–428/2—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## කොටදෙණියාව ගම්සභාව

ගම්සභා ආඥාපනත—198 වැනි පරිච්ඡේදය

කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ කොටදෙණියාව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩබලිව්. එච්. ජයකොඩි,
කොටදෙණියාව ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
කළුඅග්ගල, බාඳුරාගොඩ,
1966 ඔක්තෝබර් 4 වැනි දින.

### යෝජනාව

1962 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි උප වගන්තිය යටතේ කොටදෙණියාව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් වර්ෂ 1965 ක්වූ ජූලි මස 2 වැනි දින අංක 14,440 දරණ ගැසට් පත්‍රයේ පළ කරනලද යෝජනාවෙන් සම්මතවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර, 1966 ක්වූ මැයි මස 13 වැනි දින අංක 14,695 දරණ ගැසට් පත්‍රයේ පළ කරනලද දැන්වීමට අමතරව මෙහි පහත සඳහන් මාවත එය ඉදිරියෙන් දක්වෙන දිග, පළල අනුව සාද හෝ නැවත සාද හෝ පවත්වා ගෙන යා යුතු යයි, ආර්. ඇල්. ජයකොඩි මහතා විසින් ගෙනෙන ලද යෝජනාව බී. ඒ. ජෝන් සිංඤෝ මහතාගේ ස්ථිරත්වයෙන් ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

| අංකය | පාරේ නම | දිග සැ. | ප. | දා. | යා. | පළල අඩි |
|---|---|---|---|---|---|---|
| 30 | කොටදෙණියාව මංකඩ පාර | — | — | 2 | — | 16 |

10-468—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ පූගොඩ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1967 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත්කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ පූගොඩ ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන හේතුවක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම් කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇල්. ඇම්. දීන්, කුමාරිමුල්ල, පූගොඩ | හරක් මස් සහ එළු මස් | පූගොඩ මාර්කට් අංක 5, කඩය |

ඒ. එච්. ඒ. ඇම්. පී. ගුණරත්න,
පූගොඩ ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය, තිත්තපත්තර,
1966. 9. 26.

10-465—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## මහව ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනතයි

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1967 වර්ෂයට ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන මහව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දක්වෙන ලියවිලි පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දින දහහතරක් ඇතුලත මා වෙත එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන පණත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඇම්. හමීඩ්, නො. 34, පුත්තලම් පාර, කුරුණෑගල | හරක් මස් | ගම්සභා මාර්කට් ගොඩනැගිල්ල |
| ඇම්. හමීඩ්, නො. 34, පුත්තලම් පාර, කුරුණෑගල | එලු මස් | ගම්සභා මාර්කට් ගොඩනැගිල්ල |

ධීරසේන සුමතිරත්න,
ගම්සභාපති.

ගම්සභා කාර්යාලය,
මහව.

10-456—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩන්ගස්ලන්ද ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයෙහි සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙහි යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය ,මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩන්ගස්ලන්ද ගම්සභාව විසින් පළාත් පාලන ආයතන "පොදු අතුරු ව්‍යවස්ථා පනතේ" (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩබ්ලිව්. ඇම්. පියසේන,
දොඩන්ගස්ලන්ද ගම්සභාවේ සභාපති.

1966 සැප්තැම්බර් මස 20 වැනි දින,
දොඩන්ගස්ලන්ද ගම්සභා කාර්යාලයේදීය.

10-442—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළ කරනු ලැබේ.

### යෝජනාව

"ප්‍රදේශ පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්ද වූ ද, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව වර්ෂ 1966 ක්වූ ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල, 39, 40 සහ 41 වැනි කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා, (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ."

ඇම්. ජී. කරුණාදාස,
උඩපළාත කඳුකර ඉහළ ගම්සභාවේ
සභාපතිතැන.

1966 ක්වූ ඔක්තෝබර් මස 5 වැනි දින,
උඩපළාත කඳුකර ඉහළ ගම්සභා කාර්යාලයේ දීය.

10–424—66.10.14 දින අංක 14,717 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.**

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. එහි දැක්වෙන නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් බාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

## උපලේඛනය

**1966**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | ... | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජුලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කම්හල සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.